විභාග අංකය :

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2022

අප්‍රේල් - 2024

**BMGT E 1035** - ව්‍යාපාර ආර්ථික විද්‍යාව

කාලය : පැය 03 යි

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය A කොටස, B කොටස සහ C කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විතය.
- A කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරාගෙන එය මෙම පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම යටින් ඉරක් ඇඳ සලකුණු කරන්න. තවද ප්‍රශ්න පත්‍රයේ A කොටස විභාග ශාලාවෙන් පිටතට රැගෙනයාම සපුරා තහනම්ය.
- B කොටසෙහි හා C කොටසෙහි රචනා ශෛලියේ ප්‍රශ්න හයක් (06) ඇතුලත් වේ.
- B කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) සහ C කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න එකක් (01) තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- ජංගම දුරකථන, ස්මාර්ට් පරිගණක හෝ වෙනත් අංකිත උපාංගයන් භාවිතා කිරීම තහනම් වේ.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු ලැබේ.
- මුළු ලකුණු 100.

## A කොටස

1. පහත ප්‍රකාශ වලින් කුමක් අසත්‍ය වේද?

   අ) හිඟකම සියලු ආර්ථිකයන් සඳහා බලපානු ලැබේ.

   ආ) මූලික ආර්ථික ගැටළුව යනු විකල්පයන් අතරින් එකක් තෝරා ගැනීමකි.

   ඇ) නිෂ්පාදන සාධකවල සැපයුම සීමිතය.

   ඈ) සීමිත පාරිභෝගික උවමනාවන් නිසා තේරීම අවශ්‍ය වේ.

2. යම් රටක පාන් වැනි එදිනෙදා භාණ්ඩ මිලදී ගැනීමට පාරිභෝගිකයින්ට දිගු පෝලිම්වල සිටීමට සිදු විය. ඔවුන්ට බොහෝ තේරීම් නොතිබුන අතර රජය විසින් පාලනය කරන ලද කර්මාන්තශාලා තිබුණි. ඔවුන් ජීවත් වූයේ කුමන ආකාරයේ ආර්ථිකයකද?

අ) සම්ප්‍රදායික ආර්ථිකයක්.

ආ) විධාන ආර්ථිකයක්.

ඇ) නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක්.

ඈ) මිශ්‍ර ආර්ථිකයක්

3. රජය විසින් භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කරන විට, පහත වගන්ති සම්බන්ධයෙන් කවර වරණයක් සත්‍ය වේද?

I. ඉල්ලුමෙහි ඉහල යාමක්

II. සැපයුමෙහි ඉහල යාමක්

III. භාණ්ඩ වල හිඟයක්

අ) I පමණි

ආ) I සහ II පමණි

ඇ) I සහ III පමණි

ඈ) III පමණි

4. පොල් වල ඉල්ලුම් ශ්‍රිතය සහ සැපයුම් ශ්‍රිතය Qd= 300-6p සහ Qs= 20+8p වේ. පොල් ගෙඩියක මිල රු.15ක් වනවිට පොල් වෙළඳපලේ,

අ) සමතුලිතයක් ඇති වේ.

ආ) අධි ඉල්ලුමක් ඇති වීම නිසා මිල ඉහළ යයි.

ඇ) අධි ඉල්ලුමක් ඇති වීම නිසා මිල පහළ යයි.

ඈ) අධි සැපයුමක් ඇති වීම නිසා මිල ඉහළ යයි.

5. උපයෝගිතා යනු මැනිය හැකි සහ ප්‍රමාණ කළ හැකි සංකල්පයක් බව යෝජනා කරන්නේ පහත සඳහන් කුමන උපයෝගිතා ප්‍රවේශය මගින්ද ?

අ) එකක්වත් නොවේ

ආ) ක්‍රම සූචක උපයෝගිතා න්‍යාය

ඇ) සංඛ්‍යා සූචක උපයෝගිතාවය

ඈ) ක්‍රම සූචක උපයෝගිතා න්‍යාය සහ සංඛ්‍යා සූචක උපයෝගිතා න්‍යාය යන දෙකම

6. ප්‍රසාරණ මාර්ගයෙන් විස්තර වනුයේ ,

අ) විවිධ නිමවුම් මට්ටම් නිෂ්පාදනයට අවශ්‍ය අවම පිරිවැයක් සහිත යෙදවුම් සංයෝගයන්

ආ) ආයතනයේ යෙදවුම් සඳහා වූ ඉල්ලුම් වක්‍රය.

ඇ) දෙන ලද නිමවුම් මට්ටමක් නිෂ්පාදනයට අවශ්‍ය විවධ යෙදවුම් සංයෝගයන්

ඈ) ඉහතින් සදහන් සෑම වගන්තියකින්ම එය විස්තර කෙරේ.

7. සම නිෂ්පාදන සහ සම පිරිවැය රේඛාවක් අතර ස්පර්ශක ලක්ෂයක් මගින් හඳුනා ගනු ලැබෙන්නේ,

අ) විවිධ මට්ටම්වල නිමැවුම් නිපදවීමට අවශ්‍ය අවම වියදම් සහිත යෙදවුම් සංයෝගය.

අ) ලබා දී ඇති යෙදවුම් මට්ටමක් භාවිතයෙන් නිපදවිය හැකි විවිධ නිමැවුම් මට්ටම්.

අ) ලබා දී ඇති නිමැවුම් මට්ටමක් නිපදවීමට භාවිතා කළ හැකි විවිධ යෙදවුම් සංයෝග.

අ) දී ඇති නිමැවුම් මට්ටමක් නිපදවීමට අවශ්‍ය අවම වියදම් යෙදවුම් සංයෝගය

8. නිෂ්පාදන ශ්‍රිත යනු කුමක්ද?

අ) භෞතික යෙදවුම් සහ භෞතික නිමැවුම් අතර තාක්ෂණික සම්බන්ධතාවය.

ආ) ස්ථාවර නිෂ්පාදන සාධක සහ විචල්‍ය නිෂ්පාදන සාධක අතර සම්බන්ධතාවය.

ඇ) නිෂ්පාදන සාධකයක් සහ එය විසින් නිර්මාණය කරන ලද උපයෝගීතාව අතර සම්බන්ධතාවය.

ඈ) නිමැවුම් ප්‍රමාණය සහ එය නිපදවීමට ගතවන කාලය අතර සම්බන්ධතාවය.

9. කෙටි කාලීනව, සමාගමේ නිෂ්පාදන වක්‍රය පෙන්නුම් කරන්නේ,

අ) AP අඩු වීමට පටන් ගන්නා විට TP අඩු වීමට පටන් ගනී නමුත් අඩු වන වේගයකින් වැඩි වේ.

ආ) MP AP ට සමාන වන විට, AP අඩු වීමට පටන් ගනී නමුත් උපරිමයට ළඟා වේ.

ඇ) MP වක්‍රය පහතින් AP වක්‍රය කපන විට, AP = MP වේ.

ඈ) දෙවන අදියරේදී, TP අඩු වන වේගයකින් වැඩි වන අතර මෙම අදියර අවසානයේ උපරිමයට ළඟා වේ.

10. “හීනවන ආන්තික ඵලදා නීතිය” අදාළ වන්නේ,

අ) කෙටි කාලීනව, නමුත් දිගුකාලීන නොවේ.

ආ) දිගු කාලීනව නමුත් කෙටි කාලීනව නොවේ.

ඇ) කෙටි කාලීන සහ දිගු කාලීන යන දෙකම.

ඈ) කෙටි කාලීන හෝ දිගු කාලීන නොවේ

11. වෙළඳපලට ඇතුල්වීමට ඇති බාධක ලෙස විස්තර කරන්නේ කුමක්ද?

අ) නව තරඟකරුවන්ගේ පැමිණීමෙන් සමාගමක් ආරක්ෂා කරන ඕනෑම දෙයක්.

ආ) ඒකාධිකාරයක්, ආර්ථික ලාභයක් ඉපැයීම වළක්වන රජයේ රෙගුලාසියකි.

ඇ) නිමැවුම් ප්‍රසාරණය කිරීමට බාධාවක් ඇති කරන දෙයක්.

ඈ) කිසිදු නව සමාගමකට වෙළඳපොළට ඇතුළු වීමට අවශ්‍ය නොවන පරිදි දැනටමත් වෙළඳපොලේ ආර්ථික පාඩු ලබන සමාගම්

12. ලාබ උපරිම කර ගැනීමේ මූලික නියමය වන්නේ, ආයතනයක් ලාභ උපරිම කර ගැනීම සඳහා නිෂ්පාදනය කල යුතු නිමවුම් මට්ටම වන්නේ,

අ) TR = TC වන විටය

ආ) TR - TC = 0 වන විටය

ඇ) MR = MC වන විටය

ඈ) AR = M වන විටය

13. පූර්ණ තරඟකාරී ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් වන්නේ,

අ) වෙළෙඳ පොළේ සමජාතීය භාණ්ඩ අලෙවි කරන බැවිනි.

ආ) සැපයුම්කරු මිල තීරකයකු බැවිනි.

ඇ) සැපයුම්කරු මිල ගනුවකු බැවිනි.

ඈ) සැපයුම්කරුට ප්‍රමාණවත් තොරතුරු නොලැබෙන බැවිනි.

15. පහත සඳහන් දේවලින් කතිපයාධිකාරී වෙළඳපොළක් වඩාත් හොඳින් විස්තර කරන්නේ කුමක්ද?

අ) බොහෝ ඒකාධිකාරීව තරඟකාරී වූ සමාගම්.

ආ) ඒකාධිකාරී බලය බෙදාගන්නා සමාගම් කිහිපයක්.

ඇ) රජය විසින් කඩා බිඳ දැමූ හිටපු ඒකාධිකාරයක් .

ඈ) රජය විසින් ලබා දුන් වරලත් ව්‍යාපාරයක් හෝ ඒකාධිකාරයක්.

16. සාර්ව ආර්ථික විද්‍යාවේ ප්‍රශ්නයක් නොවන්නේ පහත සඳහන් මොනවාද?

අ) ගෙවුම් ශේෂය සම්බන්ධ ගැටළු

ආ) කෘෂිකාර්මික අංශයේ මිල තීරණය කිරීම

ඇ) උද්ධමනය සහ විරැකියාව අතර සම්බන්ධතාවය

ඈ) අයවැය හිඟයේ ඇති විය හැකි බලපෑම ආයෝජන මට්ටම මත වැඩි වීම

17. ප්‍රසරනාත්මක මූර්ත ප්‍රතිපත්තියෙහි බලපෑමෙන් ,

a) $G\uparrow \rightarrow AD\uparrow \rightarrow$ IS වමට විතැන වේ $\rightarrow Y\uparrow \rightarrow mt\uparrow \rightarrow msp\downarrow \rightarrow r\uparrow$

b) $G\uparrow \rightarrow AD\downarrow \rightarrow$ IS දකුණට විතැන් වේ $\rightarrow Y\downarrow \rightarrow mt\downarrow \rightarrow msp\uparrow \rightarrow r\uparrow$

c) $G\uparrow \rightarrow AD\uparrow \rightarrow$ IS දකුණට විතැන් වේ $\rightarrow Y\uparrow \rightarrow mt\uparrow \rightarrow msp\downarrow \rightarrow r\uparrow$

d) $G\uparrow \rightarrow AD\uparrow \rightarrow$ IS දකුණට විතැන් වේ $\rightarrow Y\uparrow \rightarrow mt\downarrow \rightarrow msp\downarrow \rightarrow r\downarrow$

18. වැය කල හැකි අදායම යනු කුටුම්භයන් විසින් වියදම් කිරීම සඳහා පවතින ශුද්ධ ආදායම යනුවෙන් හඳුන්වන්නේ,

අ) ඔවුන් සංක්‍රාම ලබාගෙන රජයට බදු ගෙවීමට පෙර ආදායමයි.

ආ) ඔවුන් සංක්‍රාම ලබාගෙන රජයට බදු ගෙවීමෙන් පසුව ආදායමයි.

ඇ) ඔවුන්ට සංක්‍රාම ලැබුණු පසු නමුත් රජයට බදු ගෙවීමට පෙර ආදායමයි.

ඈ) ඔවුන් සංක්‍රාම ලැබීමට පෙර නමුත් රජයට බදු ගෙවීමෙන් පසු ආදායමයි.

19. රජයේ වියදම් අඩුවීම නිසා,

අ) LM වක්‍රය ඉහළට විතැන් වේ.

ආ) IS වක්‍රය වමට විතැන් වේ.

ඇ) LM වක්‍රය පහලට විතැන් වේ.

ඈ) IS වක්‍රය දකුණට විතැන් වේ.

20. සේවා යෝජකයින්ට පවතින දක්ෂතා සොයා ගැනීමට කාලය අවශ්‍ය වන විට සහ රැකියා සොයන්නන්ට රැකියා අවස්ථා සොයා ගැනීමට කාලය අවශ්‍ය වූ විට වඩාත් සුදුසු රැකියා මූලාශ්‍රය තෝරන්න.

අ) ඍතුමය විරැකියාව (Seasonal Unemployment)

අ) චක්‍රීය විරැකියාව (Cyclical Unemployment)

අ) ඝර්ෂණ විරැකියාව (Frictional Unemployment)

අ) ව්‍යුහාත්මක විරැකියාව ( Structural Unemployment)

(01 x 20 = ලකුණු 20)

## B කොටස

ප්‍රශ්න අංක **01**

අ) මෙම සංකීර්ණ ආර්ථික පරිසරය තුළ විවිධ ආර්ථික සංසිද්ධීන් අවබෝධ කර ගැනීමේදී සුක්ෂම ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව එකිනෙකට අනුපූරක වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 05)

ආ) යම් නිෂ්පාදනයක් සඳහා පහත ඉල්ලුම සහ සැපයුම් වක්‍රය පහත දැක්වේ.

$$Qs = 50000\,P$$

$$QD = 130{,}000 - 15000\,P$$

කර්මාන්තය සඳහා සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය කොපමණද?

(ලකුණු 02)

ඇ) ආදායම් මට්ටම රු. 1000 සිට රු. 1200 දක්වා වැඩි වේ. ආයතනේ විකුණුම් ඒකක 5000 සිට 8000 දක්වා ඉහල යයි. මෙම භාණ්ඩයේ ආදායම් නම්‍යතාව ගණනය කරන්න.

(ලකුණු 03)

ඇ) පහත සංසිද්ධීන්ට ප්‍රතිචාර වශයෙන් ආර්ථික විද්‍යා පෙළ - පොත් සඳහා වන ඉල්ලුම් වක්‍රයට කුමක් සිදුවේද යන්න පැහැදිලි කරන්න.

(i) ශිෂ්‍යයන්ට දෙන ශිෂ්‍යාධාර වැඩි වීම

(ii) ශිෂ්‍ය නිවාසවල කුලී වැඩිවීමක්.

(iii) ආර්ථික විද්‍යා පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාවේ වැඩිවීමක්.

(iv) පොත් මිල අඩු කිරීම් ලබා දෙන පොත් සාප්පු අතර මිල යුද්ධයක්.

(v) විශ්වවිද්‍යාල පුස්තකාල භාවිතය සඳහා ගාස්තුවක් හඳුන්වා දීම.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

ආ) සංඛ්‍යා සුචක උපයෝගිතා න්‍යාය යටතේ මුළු උපයෝගිතා සහ ආන්තික උපයෝගිතා ගණනය කිරීම විස්තර කිරීම සඳහා උදාහරණයක් සපයන්න.

(ලකුණු 06)

ආ) ක්‍රම සුචක උපයෝගිතා න්‍යාය යටතේ උපේක්ෂා වක්‍ර සහ අයවැය සීමාවන් භාවිතයෙන් පාරිභෝගික සමතුලිතතාවය රූපානුසාරයෙන් විශ්ලේෂණය කරන්න. පාරිභෝගිකයෙකු සමතුලිතව සිටීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි මොනවාද?

(ලකුණු 08)

ඇ) සම නිෂ්පාදන වක්‍රයක (ISO - quant) ලක්ෂණ පැහැදිලි කරන්න

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) සත්‍ය සහ ව්‍යංග පිරිවැය ඇතුළුව සමාගම් විසින් මුහුණ දෙන විවිධ වර්ගයේ පිරිවැය සාකච්ඡා කරන්න. එක් එක් වර්ගයේ පිරිවැය සඳහා උදාහරණ සපයමින් නිෂ්පාදන තීරණ වලදී ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) ඒකාධිකාරී ආයතනයක ඉල්ලුම් හා මුළු පිරිවැය ශ්‍රිතයන් පහත පරිදි වේ.

$$P = 500 - 10Q$$

$$TC = 10Q^2 + 100Q$$

i) ආයතනයේ ලාභ උපරිම වන මිල හා නිමැවුම තීරණය කරන්න.

ii) ලාභය කොපමණද යන්න ගණනය කරන්න.

(ලකුණු 08)

ඇ) කෙටිකාලයේදී යෙදවුම් වලින් අඩුම තරමින් එක යෙදවුමක්වත් ස්ථාවරව තිබෙන අතර ආයතනයට නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය නම් එය කළ හැක්කේ නිෂ්පාදන විචල්‍ය සාධක ප්‍රමාණය වැඩි කිරීමෙන් පමණි. ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නෙහිද? නිෂ්පාදකයෙකු කෙටිකලයෙදී ලාභ උපරිම කරන ප්‍රශස්ත අදියර කුමක්ද?

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **04**

අ) ඒකාධිකාරි වෙළඳපොලක ලක්ෂණ පූර්ණ තරඟ වෙළඳපොලක ලක්ෂණ සමග සංසන්දනය කර, වෙළඳපොල ව්‍යුහයන් තුල කෙටිකාලීනව ලාභ තීරණය වන ආකාරය දක්වන්න

(ලකුණු 08)

ආ) "වෙනත් සමාගම් ඒකාධිකාර වෙළඳපොළට ඇතුළු වීම වළක්වන සමාජ, දේශපාලන හෝ ආර්ථික බාධාවන් පවතී". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) මිල හැරුණු කොට , ඒකාධිකාරී තරඟකාරී ආයතනයක් තම වෙළඳපොල කොටස වැඩි කර ගැනීම සඳහා භාවිතා කරන උපායමාර්ගයන් විස්තර කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

## C කොටස

ප්‍රශ්න අංක **05**

අ) " කේන්සියානු සංකීර්ණ ආකෘතියට අනුව භාණ්ඩ හා සේවා වෙළඳපොල හා මුදල් වෙළඳපොල අතර අන්තර් ආදියාවක් පවතී." ඔබ මෙම ප්‍රකාශය සමග එකගවන්නේද? ඔබගේ පිළිතුර සාධාරනීකරණය කරන්න

(ලකුණු 05)

ආ) මුදල් ඉල්ලුම සඳහා වන ප්‍රේරණයන් (motives) තුන මොනවාද?

(ලකුණු 05)

ඇ) IS – LM ආකෘතිය භාවිතයෙන් පහත සංසිද්ධීන්ගෙන් ආර්ථිකයට වන බලපෑම විමර්ශනය කරන්න.

(i) රජය විසින් මුදල් සැපයුම ඉහල නැංවීමට තීරණය කිරීම

(ii) පරිභෝජනය සඳහා විශාල ඉල්ලුමක් පැවතීම

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **06**

අ) ජාතික අදායම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? එය ගණනය කිරීමේ වැදගත්කම් තුනක් ගෙනහැර දක්වන්න.

(ලකුණු 04)

ආ) උපකල්පිත ආර්ථිකයකට අදාලව පහත තොරතුරු සපයා ඇත.

$C = 50 + 0.8y$ (පරිභෝජන ශ්‍රිතය)

$Tx = 50 + 0.2y$ (බදු ආදායම)

$I = 100$ (ආයෝජන)

$G = 250$ (රාජ්‍ය වියදම)

දී ඇති තොරතුරු පදනම් කරගෙන ජාතික සමතුලිත ආදායම ගණනය කරන්න.

(ලකුණු 04)

ඇ) පහත සඳහන් මාතෘකාවන්ට අදාලව වර්තමාන ස්වරූපය සහ ශ්‍රී ලංකා ආර්ථිකයට ඒවායේ බලපෑම සාකච්ඡා කරන්න.

(i) ශ්‍රී ලංකාවේ උද්ධමනය සහ සේවා වියුක්තිය

(ii) ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය සහ ආර්ථික සංවර්ධනය

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**